# අලයියඩි වෙම්බු ප්‍රාදේශිය සභාව

## අම්පාර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන .

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 16 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 අගෝස්තු 21 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 ජනවාරි 29 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 . මතය .

ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ අලයියඩි වෙම්බු ප්‍රාදේශිය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර පිළියෙල, 2010 දෙසැම්බර් 31 දිනට අලයියඩි වෙම්බු ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3. මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ අදහස් දැක්වීම්.

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි .

(ආ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

1.3.2 ගණකාධිකරණ අඩුපාඩු

-----------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරික්ෂණය විය .

(අ) හරිවැරදි බැලූ ශේෂය වෙනුවට පොත් අගය මත විදුලි උපකරණ තොගය රු . 140,704 ක් ලෙස දක්වා තිබුණි .

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 172(2) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශයන් හි විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

(ඇ) සභාවේ ඉඩම් සහ ගොඩනැගිලි අගය කර ගිණුම් වලට ගෙන නොතිබුණි .

1.3.3 අනුකූල නොවීම්

--------------------

පහත සඳහන් නීති , රීති . රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරික්ෂණය විය .

| නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | | අනුකූල නොවීම් . |
|---|---|---|
| ( අ ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - 1988 . | | |
| රීති අංක 180 | - | මුදල් සහ ගබඩා පරිහරණය කරන නිලධාරින් ආරක්ෂිත ඇප තබා නොතිබුණි . |
| රීති අංක 217 | - | සභාව පීඑස් 46 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි . |
| රීති අංක 218 | - | සුදුසු නිලධාරියෙකු විසින් ඉඩම් සහ ගොඩනැගිලි සමික්ෂණය කර නොතිබුණි . |
| රීති අංක 219 | - | ඉඩම් සහ ගොඩනැගිලි සඳහා වෙනම ලේඛනයක් විස්තරාත්මක ලැයිස්තුවක් සහ සමික්ෂණ වාර්තා පිළියෙල කර නොතිබුණි |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය .

2.1 මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු. 1,224,059 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු . 341,344 ක් විය.

2.2 ආදායම් පරිපාලනය .

2.2.1 . ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 370 | 346 | 8 |
| (ii) | බදු කුලී | 905 | 519 | 307 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 531 | 397 | 17 |
| (iv) | වෙනත් ආදායම් | 2,123 | 278 | 1,318 |

2.2.2 . උසාවි දඩ .

අක්කරපත්තු මහේස්ත්‍රාත් උසාවිය මගින් අයකරන ලද රු . 1,208,350 ක් වූ උසාවි දඩ ලබාගෙන පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරීමට ද කටයුතු කර නොතිබුණි .

2.2.3 . මුද්දර ගාස්තු .

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙතින් රු . 1,664,000 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි .

2.3 . වියදම් ව්‍යුහය .

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත වියදම , තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ .

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු . ' 000 | රු . ' 000 | රු . ' 000 |
| පෞද්ගලික පඩිනඩි | 8,410 | 7,359 | 1,051 |
| වෙනත් | 2,426 | 1,421 | 1,005 |
| උප එකතුව | 10,836 | 8,780 | 2,056 |
| ප්‍රාග්ධන වියදම් | 4,605 | 4,923 | (318) |
| මුළු එකතුව | 15,441 | 13,703 | 1,738 |

2.4 . මානව සම්පත් කළමනාකරණය .

අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය .

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ .

| තනතුරු වර්ගය . | අනුමත . | තථ්‍ය . |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | - |
| ද්විතියික ශ්‍රේණිය | 06 | 07 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 14 | 04 |
| වෙනත් | - | 08 |
| | 21 | 29 |

2.5 . වත්කම් කළමනාකරණය .

2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් රු. 3,237,815 ක් විය . එයින් වර්ෂය ඉක්ම වූ ලැබිය යුතු ගිණුම් වල අගය රු . 2,021,636 ක් විය .

2.5.2 අයකරගත යුතු සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු සේවක ණය එකතුව රු . 863,677 ක් විය . වර්ෂය ඉක්ම වූ හිඟ හිටි ගිණුම් ශේෂය රු. 66,279 ක් විය .

2.6 . අභ්‍යන්තර විගණනය .

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

3 . පද්ධති හා පාලන .

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ .

( අ ) ගිණුම්කරණය .

( ආ ) ස්ථාවර වත්කම් පාලනය .

( ඇ ) ආදායම් පරිපාලනය .